# පනස්හය පළාත් පාලන සභා මැතිවරණය හා සනත් ජයසූරිය

1956 පාර්ලිමේන්තු මැතිවරණය අප්‍රියෙල් මස 5, 7, 10 දිනවල පැවැත්විණි. මේ දිනවලට පනස්හයේ ජයග්‍රහණයට පනස් වසරක් පිරෙයි. පසුගිය දින පවත්වන ලද පළාත් පාලන මැතිවරණයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයට විශිෂ්ට ජයක් අත්විණි. ඒ මැතිවරණය පැවැත්වූයේ පසුගිය ජනාධිපතිවරණය පවත්වා මාස හතරක් පමණ කෙටි කාලයකින්ය. එවැනි කෙටි කාලයකින් පවත්වන මැතිවරණයකදී ජනතාව තම අදහස් වෙනස් කරන්නේ යැයි සිතිය නොහැකිය. එසේ වුවත් ඒ කාල සීමාවෙහිදී සන්ධානයේ පක්ෂ ලත් ඡන්ද සංඛ්‍යාවෙහි එකතුව ප්‍රතිශතයක් ලෙස ගත්කල මහින්ද රාජපක්ෂ මහතා ලත් ඡන්ද ප්‍රතිශතයට වඩා වැඩිය. එක්සත් ජාතික පක්ෂය ලබාගත් ඡන්ද සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස ගත් කල අඩු වී ඇත. පළාත් පාලන සභා මැතිවරණයෙන් පෙන්නුම් කෙරුණු වැදගත්ම කරුණ වනුයේ එ. ජා. පක්ෂය තවදුරටත් මෙරට පාලනය කරන ප්‍රධාන පක්ෂය නොවන බවය. අද එය පාලක පක්ෂය නොව විකල්ප පක්ෂය බවට පත්වී ඇත. සන්ධානය, එනම් පනස්හයේ දරුවන්, අද මෙරට පාලක පක්ෂය බවට පත් වී ඇත. පනස්හයෙන් අවුරුදු පනහකට පසු පනස්හයේ දරුවන්ගේ ප්‍රතිපත්ති රටට අවශ්‍ය වෙමින් ඇත. එහෙත් ප්‍රශ්නය නම් පනස්හයේ දරුවන්ට තවමත් තමන්ගේ වූ ප්‍රතිපත්ති, විශේෂයෙන්ම නූතනත්වය සම්බන්ධයෙන්, තිබෙද යන්නය.

අපි පළමුව එක්සත් ජාතික පක්ෂයේ ඉරණම පිළිබඳ කතාකරමු. දහහතර වතාවක් මැතිවරණවලින් පැරදීමෙන් පසුවත් රනිල් වික්‍රමසිංහ මහතා තවමත් පක්ෂයේ නායකත්වය දරයි. ඒ මහතා නායකත්වයෙන් නෙරපීමට හැකි පුද්ගලයකු තවමත් පක්ෂයේ නැත යන්න මෙහි තේරුම වෙයි. එස්. බී. දිසානායක මහතා ශක්ති සම්පන්න පුද්ගලයකු ලෙස රටට හැඟී ගියද තවමත් ඒ මහතාට පක්ෂයේ තැනක් නැත. ඒ මහතාගේ පැරණි මිතුරකු වූ මහින්ද විජේසේකර මහතා සංවිධායක ධුරවලින් ඉවත්කරනු ලැබුයේ පළාත් පාලන සභා මැතිවරණයෙන් ජයගත් වික්‍රමසිංහ කෙනෙකු නොවන බව අප අමතක නොකළ යුතුය. එක්සත් ජාතික පක්ෂයටද නායකත්වයෙහි වෙනසක් අවශ්‍ය වී ඇතත් ඒ සපයන්නේ කවුද? පනස්හයේ එක් ක්‍රියාදාමයක් ඒ පක්ෂයටත් බල පා ඇත. පනස්හය වන තෙක් දේශපාලන පක්ෂවල ද ක්‍රීඩා ක්ෂේත්‍රයෙහිද, වෘත්තීයවලද, පරිපාලන ක්ෂේත්‍රයෙහිද විශ්වවිද්‍යාලවලද ආදී වශයෙන් සෑම ක්ෂේත්‍රයකම පාහේ නායකත්වයෙහි සිටියෝ රාජකීය ශාන්ත තෝමස් විද්‍යාල ප්‍රමුඛ ප්‍රභූ පාසල්වල ආදී ශිෂ්‍ය ශිෂ්‍යාවෝ වූහ. බොහෝ කලකට පෙර ඒ තත්ත්වය හිමිව තිබුණේ රාජකීය හා ශාන්ත නමින් පටන්ගන්නා පාසල්වල ශිෂ්‍යයන්ට පමණය. පසු කලෙක ආනන්ද නාලන්ද ආදී පාසල්වල සිසුහු ද විසාකා ආදී පාසල්වල සිසුවියෝද මේ ප්‍රභූ සමාජයට ඇතුළත් කරගනු ලැබූහ. එහෙත් එසේ ඇතුළත් වූ පමණින් ප්‍රභූ සමාජය වෙනස් නොවිණි.

එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය එක් අවස්ථාවකදී හැරෙන්නට හිමි වී ඇත්තේ රාජකීය හා ශාන්ත තෝමස් ආදි සිසුන්ටය. එය එක් අවස්ථාවකදී පමණක් යැයි කිවහැක්කේ විජේතුංග මහතාගේ නායකත්වය අහඹුවක් වීම නිසාය. ප්‍රේමදාස මහතා පමණක් ස්වෝත්සාහයෙන් "පිටින්" නායකත්වයට පැමිණියේය. ඒ ද පනස්හයට පසුවය. පනස්හයට පළමු දෙමළ දේශපාලන පක්ෂවලද ඒ පොදු ලක්ෂණයක් විය. පොන්නම්බලම් රාමනාදන්, අරුණාශලම්, පී. පී. පොන්නම්බලම් මහත්වරු රාජකීය විද්‍යාලයේද, චෙල්වනායගම් මහතා ශාන්ත තෝමස් විද්‍යාලේද ආදි සිසුහු වූහ. ශ්‍රීලනිප පක්ෂයේ වුවද නායකත්වය ශාන්ත තෝමස් විද්‍යාලට හෝ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයට හෝ හිමිවිය. මේ තත්ත්වය යම් පමණකට හෝ වෙනස් වූයේ මාක්ස්වාදී පක්ෂවලය. එහි නායකත්වයට ආනන්ද විද්‍යාලේ ඉගෙනගත් එන්. එම්. පෙරේරා, පිලිප් ගුණවර්ධන. එස්. ඒ. වික්‍රමසිංහ ආදීහු පත්වූහ. එහෙත් ඒ පක්ෂවලද රාජකීය විද්‍යාලේ කොල්වින් ආර්. ද සිල්වා හා පීටර් කෙනමන් මහත්වරුද ශාන්ත තෝමස් විද්‍යාලේ ලෙස්ලි ගුණවර්ධන මහතා ද වූහ.

පනස්හයෙන් පසු මේ වෙනස්වීමට පටන්ගත්තේය. කොළඹ මෙන්ම කොළඹින් පිට ද නිර්ප්‍රභූ පාසල්වල ඉගෙනගත් අය ඒ ඒ ක්ෂේත්‍රවල නායකත්වයට පැමිණියහ. දේශපාලනයේ මේ වෙනස කළ ප්‍රධානියා වූයේ රෝහණ විජේවීර මහතාය. පනස්හයෙන් අවුරුදු පහළොවක් ගතවීමට පෙරම ඒ වෙනස සිද්ධවිය. මේ වකවානුවේදී මෙන් අමිර්තලිංගම් මහතා චෙල්වනායගම් මහතාගෙන් පසුව නායකත්වයට පැමිණියේය. ඉන් වැඩි කලක් යෑමට පෙර උමා මහේස්වරන්ලා හා ප්‍රභාකරන්ලා බිහිවූහ. ඒ අතර ක්‍රීඩා හා අනෙක් ක්ෂේත්‍රවලද ඒ වෙනස දැකගත හැකිවිය. ක්‍රිකට් නායකත්වය රාජකීය

© Prof. Nalin De Silva

ශාන්ත තෝමස් විද්‍යාලයේ සේරමලා, සතාසිවම්ලා, ප්‍රින්ස්ලා, ගුණසේකරලාගෙන් ආනන්ද නාලන්ද විද්‍යාලවල වර්ණපුරලාට, අර්ජුනලාට, මාවන්ලාට හා මහේලලාට මාරු වී ඇත. ඒ අතර මාතර නිර්ප්‍රභූ විද්‍යාලයකින් පැමිණි සනත් ජයසූරිය මහතාද විය. අද ඉදිහිට හෝ මලල ක්‍රීඩාවල පදක්කම් දිනන්නේ ඩන්කන් වයිට්ලා නොව සුසන්තිකාලා, දර්ශාලා හා චින්තකලාය. (දමයන්ති දර්ශා මෙනවිය කොළඹ කාන්තා විද්‍යාලයට ඇතුළත් වූයේ ක්ෂේත්‍රයෙහි දක්ෂකම පැමෙන් පසුවය.) එහෙත් මේ සියල්ල මැද සිදුවී ඇති වෙනස කුමක්ද? සනත් ජයසූරිය මහතාගේ අතේ ඇති පිරිත් නූල් සී. අයි. ගුණසේකර මහතාගේ අතේ නොවීය. එහෙත් ඉන් එහාට සිදුවී ඇත්තේ ගුණසේකර මහතාගේ සමාජයට ක්‍රමයෙන් ජයසූරිය මහතා ඇතුල්වීම නොවේද? පනස්හය අවසානයේදී පිරිත් නූලට සීමා විය යුතු නොවෙයි. මහින්ද චින්තන නමට පමණක් මහින්ද නොවිය යුතුය.

එ. ජා. පක්ෂය ප්‍රභූ පාසල්වල අවසන් බලකොටුව වෙයි. සමාජයට ඒ බිඳදැමීමට අවශ්‍ය වී ඇති නමුදු ඒ සඳහා සමත් අයකු සොයාගැනීමට තවමත් නොහැකිවී ඇත. ඒ අතර එජාප අර්බුදය උග්‍රවෙයි. එහෙත් පනස්හයේ සිට සමාජයට ඇත්තටම අවශ්‍ය වී ඇත්තේ ප්‍රභූ සංස්කෘතිය බිඳ දැමීමටද, එසේත් නැත්නම් ප්‍රභූ සංස්කෘතිය, එනම් බටහිර ක්‍රිස්තියානි නූතනත්ව සංස්කෘතිය, පළල්කර හැකිනම් පහළ ස්ථාවරයද එයට ඇතුළත් වීමද? සමාජය නූතනත්වයට විරුද්ධවන්නේ එක් පැත්තකින් එයට අකමැති බැවින් මෙන්ම තවත් පැත්තකින් ජනතාවට එහි වරප්‍රසාද නැතිවීමද නිසාය. පනස්හයෙන් නූතනත්ව සංස්කෘතිය පළල් ස්ථරයකට විවෘත කිරීමද සිදුවී ඇත. ඒ පළල්කළ හැක්කේ ශ්‍රීලනි පක්ෂයට මිස එ. ජා. පක්ෂයට නොවේය යන්න අද මෙරට පහළ මධ්‍යම ස්ථරයේ සිට ඉහළට ඇති විශ්වාසය වෙයි. පනස්හයේ ජයග්‍රහණය යටින් ඒ පළල්කිරීමේ ප්‍රවනතාවද තිබී ඇත. ඒ අතර එයට සිංහල බෞද්ධ සංස්කෘතිය විරුද්ධත්වයක්ද ඇත. ඒ විරුද්ධත්වයට යම් ආකාරයක ප්‍රවාදාත්මක පසුබිමක් සැපයීම අපේ එක් කාර්යභාරයක් වෙයි. ඒ ප්‍රවාදාත්මක පසුබිම කෙසේවත් මාක්ස්වාදයෙන්, පශ්චාත් මාක්ස්වාදයෙන් හෝ ඊනියා පශ්චාත් නූතනවාදයෙන් හෝ ලබාගත නොහැකිය. ජනතා විමුක්ති පෙරමුණ තවමත් ඒ බව තේරුම්ගත් බවක් නොපෙනෙයි.

ජවිපෙ අද ද පසුවන්නේ අඩිතක්සේරුවකය. මැතිවරණයේ ප්‍රතිඵල කෙසේ විග්‍රහ කළද ජවිපෙට බලාපොරොත්තු වූ ප්‍රතිඵල නොලැබිණි. ඔවුන් සන්ධානයෙන් ඉල්ලූ සභා 35 ජයග්‍රහණය කිරීමට නොහැකි විය. පසුගිය කාලයේදී යම් යම් හේතු නිසා එය ජාතිකවාදී මාවතක් ගෙන ඇති බව පැහැදිලිය. එහෙත් ජාතිකවාදී මතවාදයකට කැමති බොහෝ දෙනා තවමත් සිටින්නේ සිංහලත්වයේ පක්ෂය බවට පනස්හය වන විට පත්ව සිටි ශ්‍රීලනි පක්ෂය සමඟය. ජවිපෙ ඒ බව අමතක නොකළ යුතුය. පනස්හයේ දරුවන් තමන් පමණක් නොවන බවත් පනස්හයේ දරුවන්ගෙන් අතිවිශාල බහුතරය ශ්‍රීලනිප සමඟ බවත් ජවිපෙ සිහිතබා ගත යුතුය. ශ්‍රීලනි පක්ෂයේ නායකත්වයේ විවිධ මත දරන කොටස් සිටියද තවමත් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි අරටුව ඇත්තේ ඒ පක්ෂයට ඡන්දය දෙන්නන් අතර මිස ජවිපෙට ඡන්දය දෙන්නන් අතර නොවෙයි. ජ. වි. පෙරමුණෙහි උගත් ගැමි තරුණයන් සිටින බව ඇත්තය. එහෙත් මේ උගත් ගැමි තරුණයෝ කුමක් කොහේ උගත්තෝද? ඔවුහු බ්‍රිතානි පාසල් අනුකරණය කළ රාජකීය විද්‍යාල ආදී ප්‍රභූ පාසල් අනුකරණය කරමින් බිහි වූ තුන්වැනි ශ්‍රේණියේ අනුකාරක පාසල්වල සිංහලෙන් බටහිර අධ්‍යාපනයක් ලැබුවෝ වෙති. ඔවුන්ට ජාතිකත්වයට පැමිණිය හැක්කේ පාසලෙන් හා විශ්වවිද්‍යාලයෙන් ලැබෙන ආකෘතික අධ්‍යාපනයක් මගින් නොව ජාතිකත්වයෙන් ක්‍රමයෙන් ලබාගන්නා අධ්‍යාපනය ඔස්සේය. මේ ජාතිකත්වයෙන් ලැබෙන අධ්‍යාපනය අවිඥානිකව ලබාගන්නා පිරිස ඇත්තේ ශ්‍රී ල. නි. පක්ෂයෙහිය. ශ්‍රීලනිප නායකත්වයට මේ පිරිස හැසිරවිය හැක්කේ යම් දුරකට පමණය. පාසලින් විශ්වවිද්‍යාලයෙන් සවිඥානිකව කිනම් මට්ටමක හෝ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව අධ්‍යාපනයක් ලබමින් තවමත් අවිඥානිකව සිංහල බෞද්ධ සංස්කෘතියෙන් ලබන අනාකෘතික අධ්‍යාපනය කලින් කී අධ්‍යාපනයට යටකරන්නන්ට බටහිර නූතනත්වය හා එහි එලයක් වූ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය පරාජය කළ නොහැකිය. ගැමි උගත් තරුණයන්ගේ ඊනියා සමාජවාදයට සිංහල බෞද්ධ සංස්කෘතිය තෝතැන්නක් නොවෙයි. සනත් ජයසූරිය මහතාට ක්‍රිකට් තරගයකින් එංගලන්තය පරාජය කළ හැකි වුවද, ක්‍රිකට් පරාජය කළ නොහැකිය.

ජවිපෙ සංධානය සමඟ එක් වී තරග කළේ නම් කොළොන්නාව හැරෙන්නට අනෙක් සභා සියල්ලෙහිම එජාපය පැරදීමට තිබුණි. පනස්හයේ දරුවන්ගේ ශක්තිය කුළු ගැන්වෙන්නේ සියල්ලන් එකතු වූ විටය. එහෙත් එසේ එකතුවීම පමණක් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය පැරදවීමට ප්‍රමාණවත් නොවෙයි. ඒ සඳහා තම ප්‍රවාද ද අවශ්‍ය වෙයි. පනස්හයේ දරුවන් පාලක පක්ෂය බවට පත්වීමේ කලඑළි මංගල්‍යය පැවැත්වෙන මේ අවස්ථාවෙහිදී මතක තබාගත

© Prof. Nalin De Silva

යුතු කරුණ නම් තවමත් ඔවුන් නටන්නේ බටහිරයන්ගේ බෙරයට බවය. මේ රිලා නැටුම දැන් අවසන් විය යුතුය. පනස්හයේ දරුවන්ට තමන්ගේ ප්‍රවාද තිබිය යුතුය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva